**ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 05 දින දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී

අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි විසින් එම විධිවිධානවලට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
| --- | --- | --- | --- |
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1<br>2.2 (අ) |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.2 (ආ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.4.1 |
| | | 2. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.9 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම් | 2.13<br>2.14 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.5(අ) (i) (ii) |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.11 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | අනාර්ථික ගනුදෙනු | 2.8 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10<br>2.12 |

| | | | |
|---|---|---|---|
| | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව. | | |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.18 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | පාඩු හා හානි | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

**සැලැසුම් කිරිම**

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. එම සැලැස්මේ දෙපාර්තමේන්තුව විසින් ඉටු කිරීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යභාර්යන් 07 කින් කාර්යභාරයන් 05 ක් පමණක් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණු අතර ඒ සඳහා සලසා තිබූ ප්‍රතිපාදනය රු.මිලියන 58ක් විය.

### 2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------------------------------------

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන කාර්යභාරයන් 05 ඇතුළත ඉටු කිරීමට සැලැසුම් කළ කාර්යයන් 17 කින් "පරිවර්තකයින් සඳහා සිංහල / ඉංග්‍රිසි අත්පොත් සම්පාදනය" කිරීමේ කාර්යය පමණක් ඉටු කර නොතිබුණු අතර ඒ සඳහා සලසා තිබූ ප්‍රතිපාදනය රු. මිලියන 0.200 ක් වී තිබුණි.

(ii) පාරිභාෂිත පදමාලා අඩංගු සංයුක්ත තැටියක් නිර්මාණය කිරීම, පිටපත් සැකසීම හා විකිණීම සම්බන්ධ කාර්යය සඳහා රු. 279,750 ක් වැයකර තිබුණද, 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එම කාර්යය ඇතුළත් කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ප්‍රධාන කාර්යභාරයන් 05 ක් ඉටු කිරීම සඳහා කාර්යයන් 16ක් වෙනුවෙන් රු. මිලියන 34.77 ක් උපයෝජනය කර තිබුණත්, එම ප්‍රධාන කාර්යයභාරයන් 04 කින් කාර්යයන් 06 ක් අපේක්ෂිත නිමවුම් මට්ටම (Output) අත්පත් කර ගෙන නොතිබුණි.

## 2.3 තිරසර සංවර්ධනය

**තිරසර සංවර්ධනය අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඍජුව සම්බන්ධ නොවන බව සඳහන් කර තිබුණද, දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන් සැලකීමේදී අදාළ කරගත හැකි වන තිරසර සංවර්ධන අරමුණක් වූ " පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම " සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 24.86 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 15.92 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 8.94ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 56.12ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 2.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

එකතුව රු. 266,050 ක් වූ ප්‍රසම්පාදන කටයුතු 3 ක් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව අවශ්‍ය මිල ගණන් කැඳවීමකින් තොරව මිලදී ගෙන තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(i)** **වාහන උපයෝජනය**

----------------------

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 03 ක් පැවැති අතර එම වාහන කිලෝ මීටර් 36379 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් වෙනුවෙන් රු. 231,542 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු. 87,910 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.681,471 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු. 383,436 ක්ද වශයෙන් එකතුව රු. 1,384,359 ක් වැය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් වාහන ධාවනය කිරිම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු. 38.05 ක් වැය කර තිබුණි.

**(ii)** **ඉන්ධන දහනයවීම් පරික්ෂා නොකිරිම**

--------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනයවීම් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.6** **බැදීම් හා බැරකම්**

------------------

වැය විෂයයන් 03 කට අදාලව එකතුව රු. 40,277 ක් වූ බැරකම් 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදයට අනුව වෙන්කිරීම් රහිතව 2018 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

**2.7** **පාඩු හා හානි**

----------------

සමාලෝචිත වර්ෂයේදී නිලධාරියෙකුගේ සහ රියදුරුගේ නොසැලකිල්ල මත රු. 48,782 ක් වූ මෙස වීදුරු තොගයක් බිඳී තිබීම හා වෑන් රථයේ රියදුරුගේ නොසැලකිල්ල මත අනතුරකට ලක් වීම හේතුවෙන් රු. 68,409 ක අලාභයක් සිදු වී තිබුණි. එකතුව රු. 117,191 ක් වූ මෙම අලාභයන්ගෙන් සියයට 10 ක් පමණක් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ සාධාරණත්වය විගණනයේදී තහවුරු නොවුණි.

**2.8** **අනාර්ථික ගනුදෙනු**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දස අවුරුදු සැලැස්ම සකස් කිරීම සඳහා වෝටර්ස් එජ් සහ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පවත්වා තිබූ සමුළු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු. 285,851 ක් සහ රු. 49,497 ක් වැය කර තිබුණද 2018 ජූලි මස අවසානය දක්වාම එම සැලැස්ම සකස් කර නොතිබුණි. තවද රාජකාරි වේලාවේ සහභාගී වූ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකුට රු. 7,200 ක් සම්පත් දායක දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) භාෂා පහසුකම් සපයන්නන්ගේ පුහුණු නිලධාරි සංචිතයක් ඇති කිරිම සඳහා වන වැඩ මුළු පැවැත්වීම වෙනුවෙන් රු. 28,600 ක් වූ ශාලා පහසුකම් ලබා ගත හැකිව තිබුණද, රු. 74,800 ක් වූ වැඩි මිල සහිත ශාලා පහසුකම් ලබා ගැනීම හේතුවෙන් දෙපාර්තුමේන්තුව රු. 46,200 ක අමතර පිරිවැයක් දරා තිබුණි.

(ඇ) ලන්ච් ෂීට් (Lunch Sheet) භාවිතා කිරීම පරිසරයට හිතකාමී නොවන බව හදුනාගෙන තිබුණ බැවින් එම තත්ත්වය අවම කිරීමට රු. 66,900 ක් වැය කර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 124 කට කෑම පෙට්ටි මිලදී ගෙන තිබුණද, භෞතික පරීක්ෂාවේදී නිලධාරීන් 11 දෙනෙකු

පමණක් එම බහලුම් භාවිතා කර තිබීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටුවී නොතිබුණි.

## 2.9 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව මහජනයාට තොරතුරු සැපයීම සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද, 2017 වර්ෂයේදී මහජන පැමිණිලි දෙකක් ලැබී තිබුණු අතර, ඉන් එක් පැමිණිල්ලක් සඳහා තොරතුරු ලබා දීමට මාස 02 ක කාලයක් ගතවී තිබුණි.

(ආ) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම, ඒ තුළින් අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 84 | 63 | 21 | 25 |
| | මූලධන | 35 | 23 | 12 | 34 |
| | **එකතුව** | **119** | **86** | **33** | **28** |
| 2014 | පුනරාවර්තන | 72 | 71 | 01 | 01 |
| | මූලධන | 31 | 25 | 06 | 19 |
| | **එකතුව** | **103** | **96** | **07** | **07** |
| 2015 | පුනරාවර්තන | 97 | 91 | 06 | 06 |
| | මූලධන | 40 | 39 | 01 | 03 |
| | **එකතුව** | **137** | **130** | **07** | **05** |
| 2016 | පුනරාවර්තන | 101 | 95 | 06 | 06 |
| | මූලධන | 45 | 41 | 04 | 09 |
| | **එකතුව** | **146** | **136** | **10** | **07** |
| 2017 | පුනරාවර්තන | 137 | 132 | 05 | 04 |
| | මූලධන | 36 | 21 | 15 | 42 |
| | **එකතුව** | **173** | **153** | **20** | **12** |

**විසර්ජන ගිණුම**

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.මිලියන 0.869 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 53.88 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.5 | 7.47 | 4.0 | 4.39 | 25.0 | 21.3 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 74,116 ක් වූ අතර එම හිඟහිටි ශේෂය වර්ෂ 05ක් ඉක්මවා තිබුණි.

**2.12 පොදු තැන්පත් ගිණුම**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 1.61 ක් විය. පොදු තැන්පත් ගිණුම් අංක 6000/0000/00/0018/0120 යටතේ සමාලෝචිත වර්ෂයේ ජුලි සිට දෙසැම්බර් දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගෙවිය යුතු රු. 76,901 ක මුදල නියමිත පරිදි එම අරමුදලට බැර කර නොතිබුණි.

**2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
| --- | --- |
| (අ) බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුයි. |
| (ආ) පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ වන අකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය |

**2.14 අනුකූල නොවීම්**

**නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ඇ) ඡේදය ප්‍රකාරව කලින් ලබාදුන් අත්තිකාරම් රු.32,480 ක් පියවා නොතිබියදී, නිලධාරීන් දෙදෙනෙකුට රු.143,000 ක අත්තිකාරම් නැවත ලබාදී තිබුණි.

**2.15 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.16 විගණන හා කළමනාකරණ කමිටුව**

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

**2.17 මානව සම්පත් කළමනාකරණය**

**2.17.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 80.6 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- | --- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 06 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 58 | 28 | 30 | - |
| (iii) | ද්විතියික මට්ටම | 136 | 125 | 11 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 09 | 10 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 05 | - | 05 |
| | | ------ | ------- | ------ | ----- |
| | **එකතුව** | **224** | **173** | **56** | **05** |
| | | === | === | === | === |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම**

විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා අනියම් සහ කොන්ත්‍රාත් නිලධාරීන්/ සේවකයින් 05 බඳවා ගෙන තිබුණි.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරිම**

සමාලෝචිත වර්ෂයේදී පුහුණුව ලබා දිය යුතු නිලධාරීන් සංඛ්‍යාව 166 ක් ලෙස හඳුනාගෙන තිබුණද නිලධාරීන් 127 දෙනෙකු වර්ෂය තුල කිසිදු පුහුණුවක් සඳහා යොමු කර නොතිබුණි. 2017 වර්ෂයේදී පුහුණුව ලත් නිලධාරීන් 39 කින් 11 දෙනෙකු එක් දින පුහුණුවක් පමණක් ලැබූ අය වූ අතර පුහුණුව සඳහා යොමු කළ යුතු නිලධාරීන්ගෙන් සියයට 23 ක් පුහුණු කිරීම සඳහා රු. 1,606,166 ක් වැය වී තිබුණි.

## 2.18 රජයේ නිලධාරීන් ඇප තැබීම

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මුදල් භාරගැනීම සහ භාරව සිටින නිලධාරීන් සහ ගබඩාව භාරව කටයුතු කරන නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැන්පත් කර නොතිබුණි.